# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2350/51 - 2023 සැප්තැම්බර් මස 22 වැනි සිකුරාදා - 2023.09.22**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය, ජීවන් තොන්ඩමන් වන මම, එකී මණ්ඩලයට රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ඉඹුලාන ජල ටැංකියට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**ජීවන් තොන්ඩමන්,**
ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/04/KE/539.

2023 සැප්තැම්බර් මස 18 වැනි දින,
ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 35,
''ලක්දිය මැඳුර'',
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 100-B සියඹලාවල ග්‍රාම නිලධාරී වසමේ, සියඹලාවල ගමේ පිහිටි පිටර්හිල් එස්ටෙට් නමැති ඉඩමෙන් පර්චස් 06ක ප්‍රමාණයෙන් යුත් පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |
| *නැගෙනහිරට* | : | මාර්ගය. |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* :- බී. ධර්මලතා,
දහම්සිරි මාවත,
සියඹලාවල,
ඉඹුලාන.

EOG 09 - 0205

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.